# කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
முகாமைத்துவ சேவைகள் திணைக்களம்
DEPARTMENT OF MANAGEMENT SERVICES

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் அமைச்சு
MINISTRY OF FINANCE & PLANNING

මහා භාණ්ඩාගාරය, කොළඹ 01. பொது திறைசேரி, கொழும்பு-01. General Treasury, Colombo 01.



අන්‍යසතු කිරීම සපුරා තහනම්
අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය
අලවතුගොඩ, මහනුවර


මගේ අංකය / எனது இல. / My No. } ඩීඑම්එස්/ඩී/4/පොදු 02

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2013.04.12

නිති කටයුතු දෙපාර්තමේන්තුව
5731
12 APR 2013
කොළඹ 01.

අධ්‍යක්ෂ ජනරාල්
නීති කටයුතු දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ ජනරාල්තුමියනි

**පැමිණිලි අංකය: එච්ආර්සී/925/2013**
**පැමිණිලිකරු: ඒ.කේ. තිලකරත්න**

උක්ත කරුණ සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව ඇමතූ ඔබේ සමාංක හා 2013.03.29 දිනැති ලිපිය හා බැදේ.

02. එකී ලිපිය සමග ඉදිරිපත් කරන ලද අධ්‍යාපන අනධ්‍යන සේවක සංගමයේ ලේකම්ගේ 2013.03.12 ලිපියේ සඳහන් කරුනු සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ ඉදිරිපත් කරනු කැමැත්තෙමි.

අංක 01 ඡේදය:

අනධ්‍යන කාර්ය මණ්ඩලයේ අයත් තනතුරු වශයෙන් පැවති සනිපාරක්ෂක කම්කරු, පාසල් කම්කරු, සාමාන්‍ය කම්කරු, කාර්යාල කම්කරු, උද්‍යාන කම්කරු, විද්‍යාගාර සේවක/සහායක, පුස්තකාල සේවක/සහායක, අරක්කැමි යන තනතුරු අහෝසි කිරීමක් සිදුකර නොමැති අතර, සනිපාරක්ෂක කම්කරු, පාසල් කම්කරු, කාර්යාල කාර්ය සහායක, කාර්යාල කම්කරු, උද්‍යාන කම්කරු, රසායනාගාර සහායක, පුස්තකාල සහායක, යන තනතුරු නාම පමණක් ඒකාබද්ධ කර "පාසල් කාර්ය සහායක" ලෙස තනතුරු නාමය පමණක් සංශෝධනය කර ඇත. පළාත් පාසල් වර්ගීකරණය පදනම් කරගෙන, (1AB, 1C, Type 2, Type 3 වශයෙන්) පාසල් සඳහා අවශ්‍ය ප්‍රශස්ථ අනධ්‍යයන කාර්ය මණ්ඩලය තීරණය කිරීමට, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ, මුදල් කොමිෂන් සභාවේ හා මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එක්ව සිදුකළ පළාත් සභා කාර්ය මණ්ඩල සමාලෝචනයේදී මෙම තනතුරු නාම සංශෝධනය සිදු කරන ලදී. පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්ගේ හා ආයතන ප්‍රධානීන්ගේද සහභාගිත්වය සහිතව සිදුකළ ඉහත සඳහන් කාර්ය මණ්ඩල සමාලෝචනයේදී, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ පාසල් අනධ්‍යයන කාර්ය මණ්ඩලය තීරණය කිරීම සඳහා යොදාගත් නිර්ණායක පහත පරිදි වේ.


කාර්යාලය / அலுவலகம் } 2484757 ෆැක්ස් / பெக்ஸ் / Fax } 2430270 ඊ-මේල් / மின்னஞ்சல் / E-mail } dgms@msd.treasury.gov.lk

| තනතුරු නාමය | නිර්ණායක |
|---|---|
| මුරකරු | 1AB, 1C,හා සිසුන් සංඛ්‍යාව 200 ට වැඩි Type2 පාසලකට එක් තනතුර බැගින් |
| පාසල් කාර්ය සහායක | 1AB, 1C, Type2, පාසලකට එක් තනතුර බැගින් |
| විද්‍යාගාර සහකාර | උසස්පෙළ විද්‍යා විෂයයන් සහිත පාසලකට (1AB)එක් තනතුර බැගින් |
| අරක්කැමි | නේවාසිකාගාර සහිත පාසලකට එක් තනතුර බැගින් |
| අරක්කැමි සහායක | නේවාසිකාගාර සහිත පාසලකට එක් තනතුර බැගින් |
| නේවාසිකාගාර පාලක | නේවාසිකාගාර සහිත පාසලකට එක් තනතුර බැගින් |
| නේවාසිකාගාර උප පාලක | නේවාසිකාගාර සහිත පාසලකට එක් තනතුර බැගින් |

අංක 02 ඡේදය:

මෙම තනතුරු නාමය ස්ථාපිත කිරීම නිසා පාසල් හා කලාප කාර්යාලවල සේවකයින් අතර ගැටුම් ඇතිවීමක් සිදුවිය නොහැකි ලෙස නිර්ණය කර ඇති නිර්නායක අනුව, මෙම තනතුරු අදාල පාසල්වලට ලබාදීම තුලින් පාසල් පරිපාලනයට හා පාසල් සිසුන්ට සේවයක් සිදුවනු ඇති අතර, රාජ්‍ය දේපල ආරක්ෂාකර ගැනීමට පෙරට වඩා හැකියාවක් පාසල් පරිපාලනයට ලැබෙනු ඇත. එමෙන්ම නව තනතුරු නාමය සේවකයින්ගේ මානසික තත්වය ඉහළ දැමීමට හේතුවන බව ද විශ්වාස කරමි.

අංක 02. 01 ඡේදය:

මෙහි සඳහන් කර ඇති පරිදි සේවකයින්ගේ මූලික අයිතීන් අහෝසි වීම යන කරුණ ද පිළිගත නොහැකිය. පෙර තනතුරු නාම කිහිපයක් යටතේ අනධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු දක්නට තිබුනද කිසිදු පාසලකට එම තනතුරු නාම සියල්ල සහිත තනතුරු අනුමත කිරීමක් සිදුව නැත. ප්‍රායෝගිකව එසේ කිරීමද කළ නොහැකිය. එබැවින් පාසල් පරිපාලනයට අවශ්‍ය පරිදි රාජකාරි නියමිත [illegible] [illegible] තුළින් සේවකයින්ගේ උපරිම කාර්ය සාධනයක් ලබා ගැනීමට මෙම සංශෝධන අනුව හැකිවනු ඇත.

අංක 02. 02 ඡේදය:

පාසල් කාර්ය සහායක තනතුරු නාමය අනුමත කිරීම මගින්, ඒකාබද්ධ කරන ලද තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටින් හි අධ්‍යාපනික හා වෘත්තිය සුදුසුකම් අහෝසිවීමක් සිදු නොවේ . පාසල් කාර්ය සහායක යනු නව තනතුරක් වන අතර ඒ සඳහා අළුතින් බඳවා ගැනීම් හා උසස් කිරීමේ පරිපාටි සකස්කර අනුමත කරවා ගත යුතුය. නව බඳවා ගැනීම් හෝ දැනට සිටින කාර්ය මණ්ඩලය මෙම තනතුරු සඳහා අන්තර්ග්‍රහණය කිරීම හෝ කළ හැකි වන්නේ එම සුදුසුකම් අනුවයි. ඒ අනුව දැනට සිටින අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සුදුසුකම් අනුව නව



අන්සතු කිරීම සපුරා තහනම්
අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය
ඇල්විටිගොඩ, මහනුවර

තනතුරු සඳහා අන්තර්ග්‍රහණය කළ හැකිවනු ඇති අතර සුදුසුකම් නොමැති සේවකයින් වෙනම ඔවුනට පෞද්ගලික වනයේ පෙර තනතුරු නාම භාවිතා කළ හැකි වේ.

අංක 02. 03 ඡේදය:

පාසල් පුස්තකාල, පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ශ්‍රේණිගත කිරීම්වලට භාජනය නොකරන හෙයින් පුස්තකාලයාධිපති හෝ පුස්තකාල සහායක වැනි තනතුරු නාම පාසල් සඳහා අනුමත කළ නොහැක. යම් සේවකයෙකු මෙහි සඳහන් කර ඇති උසස්වීමක් සඳහා අයදුම්කිරිමට සුදුසුකම් සපුරා ඇත්නම්, එම තත්ත්වය නව තනතුරු නාමය අනුමත කිරීමෙන් වලක්වාලීමක් සිදු නොවේ.

අංක 02. 04 ඡේදය:

පාසල් කාර්ය සහායක තනතුරට අදාල බඳවා ගැනීමේ පරිපාටි සකස් කර අන්තර්ග්‍රහණය කිරීමේදී සේවකයින් එතෙක් ලබමින් සිටින වැටුප් අනුව ඔවුන් අන්තර්ග්‍රහණයේදී තබනු ලබන වැටුප් පියවර තීරණය වනු ඇත. ඉහත සඳහන් සියළු තනතුරු 06/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව PL කාණ්ඩයේ තනතුරු වූ අතර III/II/I/විශේෂ යන ශ්‍රේණින්ගෙන් සමන්විත විය. ඒ අනුව තනතුරුවල උසස්වීම්වලට බාධාවක් හෝ වැටුප් විෂමතාවයක් සිදු නොවේ.

අංක 02. 05 ඡේදය:

බඳවා ගැනීමේ හා උසස් කිරීම් පරිපාටි සකස් කිරීමේදී අභ්‍යන්තර උසස්වීම් ක්‍රම පිළිබඳව සලකා බලා කටයුතු කළ හැකිය.

අංක 02. 06 ඡේදය:

තනතුරට අදාල රාජකාරි තීරණය කිරිම හා පැවරීම පාසල් පරිපාලනය සතුවන අතර තම පාසලට අනුමත අනධ්‍යයන කාර්ය මණ්ඩලය අනුව රාජකාරි පැවරීම පහසුවෙන් සිදුකළ හැකිය.

අංක 02. 07 ඡේදය:

නව තනතුරට අදාලව අනුමත කරනු ලබන බඳවා ගැනීම් පරිපාටියට අනුව ඉදිරි බඳවා ගැනීම් කළ යුතු හෙයින් නව බඳවාගැනීම්වලදී කිසිදු අසාධාරණයක් සිදු නොවනු ඇත.

අංක 02. 08 ඡේදය:

රාජකාරි පැවරීමේදී ගැටළු මතුවිය හැකි බවට නිරීක්ෂණය නොකරන අතර පාසල් පරිපාලන මට්ටමින් මෙතෙක් එවැන්නක් පිළිබඳව මෙම දෙපාර්තමේන්තුව වෙත අදහසක් හෝ ඉදිරිපත් කර නැත.

අන්සතු කිරීම් සපුරා තහනම්
අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය
අලවතුගොඩ, මහනුවර

අන්සතු කිරීම සපුරා තහනම්
අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය
අලවතුගොඩ,මහනුවර

පැමිණිලිකරුගේ ලිපියේ සඳහන් කරන යෝජනා පරිදි තනතුරු නාම හෝ තනතුරු පිළිබඳව හෝ එකඟ විය නොහැක. එහි සඳහන් කර ඇති "රාජකාරිමය වශයෙන් කිසිදු වෙනසක් සිදු නොකල යුතුය" යන කොන්දේසියට යටත්ව තනතුරු නාම පමණක් සංශෝධනයට කරනු ලබන යෝජනාව, යහපත් රාජ්‍ය සේවයක් හෝ සිසු අධ්‍යාපනයට රුකුල් දීමක් හෝ පාසල් පද්ධතියේ දියුණුවක් හෝ බලාපොරොත්තුවන රාජ්‍ය නිලධාරියකුගෙන් අපේක්ෂා නොකළ යුත්තකි. එබැවින් සේවක කාර්ය සාධනය උපරිමයෙන් ලබාගැනීමට හැකිවන පරිදි පාසල් පරිපාලන කටයුතු සඳහා සහයෝගයක් ලබාදීම මෙම තනතුරු නාම සංශෝධනය හා කාර්ය මණ්ඩල සංඛ්‍යාව තීරණය කිරීමෙන් සිදුකර ඇති බව වැඩිදුරටත් කාරුණිකව සඳහන් කරමි.

මෙයට - විශ්වාසී

එන්. ගොඩකන්ද
අධ්‍යක්ෂ ජනරාල්

අන්සතු කිරීම සපුරා තහනම්
අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය
අලවතුගොඩ,මහනුවර

අන්සතු කිරීම සපුරා තහනම්
අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය
අලවතුගොඩ,මහනුවර